දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 ප්‍රථම වර පරීක්ෂණය - 2017 අප්‍රේල්
Bachelor of Arts General (External) Degree Part I Regular Examination 2014 - April 2016

# සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය
# SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි

පළමු වන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන,
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

## I කොටස

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ) පියන් නුවන් පැහැ තො පිරි මහවේ ගඟහී
නැඟි නිරිඳු කිරිඳු නැව් යෙහෙන් බිහිදොර තෙර පත්.

පියදූ උයන් කල් නලදූ රුදී සිත් ගත්
මුවරඳපට බමර බර සහ අකුරු පත් රජහට.

කව්සිළුමිණ, ඇම්.බී. ආරියපාල, (සංස්.)

(ආ) පෙරද ල නිඳු දිය කඳ රට බිම් ගලත
සුරකු ල හිමි රකිනුව ලක මැවූ සත
මනක ල ඒ සමුදුර පැහැයෙන් දිමුත
වඳු ස ල පිළිම හිමි සිරි සරණ සියපත

පෙර උවි දා ගෙන ගිරිඳා සිඳු සලත
නැගි පැහැදා පෙණ සමුදා සැටි නුමුත
මෙන උළි දා පැහැ විහිදා නෙ දිගු බිත
සැදි වට දා ගෙහි වඳු දාගැබ දිමුත

සැළලිහිණි සන්දේශය, සුචරිත ගම්ලත්, (සංස්.)

(ඇ) සො ඳ පුන්සඳ සොම් කිරණින් පිහිකුළු
වැ ද සුරගඟ රළ වට කළ සුලකුළු
න ද සිරිසර පාමින් රන්ගිරි කුළු
ඇ ඳ පිරිසිඳු සුදු සිනිඳු කසී සළු

හිමක ර සුරසිඳු කොඳ මුතු හරෙහී
පැහැස ර යුරු සුදඟර ගෙන වෙරෙහී
මලක ර පල පලු වැනි සුර තුරෙහී
මනහ ර සිවුසැට බරණින් සැරෙහී

ගුත්තිල කාව්‍යය, ඩබ්.එෆ්. ගුණවර්ධන, (සංස්.)

(ඇ) සපෙ ක් එකකු කැව නසිනේ ඔහු ම වද
අනි ක් ලොවින් නො නැසෙයි සතෙකුත් එකද
පස ක් දුදන පබු කන මුව ළං කළද
වග ක් නැසෙයි වැනැසෙයි එමතු ද ඔහුද

දිගු න් සුදු කරන සඳ අම රසින් යුත
සස න් නො හරිනෙව් කප් හිමි තමන් ගත
අනු න් සැපට සුදනෝ නෙක තැත් කරත
තම න් වැඩ පිණිස මඳකුත් නො සලකත

සුභාෂිතය, සුචරිත ගම්ලත්, (සංස්.)

(ලකුණු 28 යි.)

## II කොටස

02. අපූර්ව කාව්‍යෝක්ති උත්පාදනය සම්බන්ධයෙන් **කව්සිළුමිණ** කතුවරයා දක්වූ විශිෂ්ටතාව නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

03. ප්‍රතිභා ශක්තියෙන් යුත් රචකයෙකුගේ බන්ධචාතුර්‍ය්‍ය **සැළලිහිණි සන්දේශය** තුළින් කෙතෙක් දුරට නිරූපණය වන්නේ දැයි සනිදර්ශන ව පහදන්න.

04. චරිත නිරූපණය සම්බන්ධයෙන් ජාතක කථාවට වඩා කවර විශේෂතාවක් **ගුත්තිල කාව්‍යයෙහි** දක්නට ලැබේ දැයි නිදසුන් සහිත ව විමසුමට ලක් කරන්න.

05. "සරල බස් වහරක් යොදා ගනිමින් උපදේශය දෘෂ්ටාන්තයකින් පැහැදිලි කිරීම **සුභාෂිතයේ** විශේෂ ලක්‍ෂණයකි." නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

## III කොටස

06. සමාස පිළිබඳ **සිදත්සඟරාවෙහි** නිර්වචන, නූතන සිංහල සමාස විග්‍රහයට උපයෝගී වන අයුරු විචාරාත්මක ව විභාග කරන්න.

07. 'හකරවිනිස' මගින් සිංහල භාෂාවෙහි එක් ප්‍රස්තරයක් පිළිබඳ ව ශබ්ද විද්‍යාත්මක විමර්ශනයක් සඳහා සිදත් සඟරා කතුවරයා විසින් දරන ලද උත්සාහයෙහි ඌනතා සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

08. කම් විබත හා තත් විභක්ත්‍යර්ථ පිළිබඳ සිදත් සඟරා කතුවරයාගේ විග්‍රහය නිදසුන් කොටගනිමින් විබත් අදියරෙහි ව්‍යාකුලතා ඇතිවීමට බල පෑ සාධක පරීක්‍ෂා කරන්න.

09. අභිමත මාතෘකා තුනකට (03) ප්‍රමාණවත් විවරණ සපයන්න.
   i. අසබහව් කිරිය
   ii. අස්ත්‍යර්ථ තද්ධිත ප්‍රත්‍යය
   iii. පෙරරූ සඳ
   iv. භාවකාරක කෘදන්ත
   v. තුල්‍යාධිකරණ විශේෂණ විශේෂ

(2 - 9 පිළිතුරු සඳහා ලකුණු 18 බැගිනි.)

*****************************************